00143

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන 2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
SNU5244/ESU3144 - විෂයමාලා න්‍යාය හා පරිචය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2025.02.01 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01 වන කොටස

01. සැඟවුන විෂයමාලාව යනුවෙන් කුමක් අදහස් වන්නේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

02. අධ්‍යාපනය සහ මනෝවිද්‍යාව අතර ඇති සම්බන්ධය කෙටියෙන් සාකච්ඡා කරන්න.

03. 1932 "හත්දෙස්ස අධ්‍යාපන ක්‍රමය" හඳුන්වාදීමේ අරමුණු මොනවාද?

04. කර් (kerr) අනුව විෂය මාලාවක ඇගයීම සිදු කරන අයුරු කෙටියෙන් විස්තර කරන්න.

05. සාමාජීය අවශ්‍යතා සපුරාලීම පාසල් අධ්‍යාපනයෙහි අරමුණක් වීමේ වැදගත්කම පරීක්ෂා කරන්න.

06. විෂයමාලා කළමනාකරණයේදී පාසලේ විදුහල්පතිවරයාගේ භූමිකාවේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

07. විෂයමාලා ඇගයීම් කරුවකු සතුවිය යුතු ගුණාංග පහක් (05) දක්වන්න.

08. විෂය සන්ධාරය තෝරාගැනීමේ මූලික නිර්ණායක පහක් (05) ලැයිස්තු ගත කරන්න.
(ලකුණු 05x08=40)

## 02 කොටස

09 (i.) 'විෂයමාලාව' යන පදය සඳහා පිළිගත් නිර්වචන දෙකක් (02) දක්වන්න.
(ලකුණු 08)

(ii.) එම නිර්වචනවලට අනුව විෂයමාලාව පිළිබඳ නිර්වචනයක අඩංගුවිය යුතු ප්‍රධාන අංග හතරක් (04) හඳුනා ගන්න. (ලකුණු 06)

(iii.) ඉහත අංග සැළකිල්ලට ගනිමින් විෂයමාලාව යන පදය ඔබගේ වචනයෙන් නිර්වචනය කරන්න. (ලකුණු 06)



103

10. (i.) විෂයමාලා අරමුණු සකස් කිරීමේදී සැළකිල්ලට ගනු ලබන මූලාශ්‍ර නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii.) විෂයමාලාවක පරමාර්ථ හා අරමුණු තීරණය කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) 1998 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණු දෙකක් **(02)** සඳහන් කර නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න (ලකුණු 04)

11. (i.) ටයිලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතිය විස්තරාත්මකව පැහැදිලි කරන්න (ලකුණු 05)

(ii.) ටයිලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතියේ දුර්වලතා හඳුනාගන්න. (ලකුණු 05)

(iii.) එම දුර්වලතා වීලර්ගේ ආකෘතියෙන් මඟහරවා ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i.) විෂය සමගාමී ක්‍රියාකාරකම් යනු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ මූලික කුසලතා සංවර්ධනය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම අගයන්න. (ලකුණු 08)

(iii.) පාසල තුළදී විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට දිරිගැන්වීම කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i.) විෂයමාලා සංවර්ධන මූලධර්මවල අවශ්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) ඉන්දියාවේ අධ්‍යාපන පර්යේෂණ සහ පුහුණු කිරීමේ කවුන්සලය මඟින් ප්‍රසිද්ධියට පත්කොට ඇති විෂයමාලා සංවර්ධන මූලධර්ම ලැයිස්තුගත කරන්න. (ලකුණු 06)

(iii.) ශ්‍රී ලාංකික සංදර්භයට අදාළව නිදසුන් සපයමින් ඉහත එක් එක් මූලධර්මය මඟින් අදහස් කරන්නේ කුමක්දැයි සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 09)

14. (i.) විෂයමාලා සංවිධාන ප්‍රවේශ හතර **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii.) ඉන් එක් ප්‍රවේශයක් තෝරාගෙන එහි ස්වභාවය, කැපී පෙනෙන ලක්ෂණ, වැදගත්කම සහ දුර්වලතා සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් විෂයමාලාව සංවිධානයේදී භාවිතයට ගෙන ඇති විෂයමාලා සංවිධාන ප්‍රවේශ පරීක්ෂා කරන්න. (ලකුණු 08)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*



104